සියලු ම හිමිකම් ඇවිරිණි
All Right Reserved

අංක 01

කලාප අධ්‍යාපන කාර්යාලය - බළන්ගොඩ

පස්වන ශ්‍රේණියේ ශිෂ්‍යත්ව විභාගයට සූදානම් වන දරුවන් සඳහා

ශිෂ්‍යත්ව විභාගය පෙරහුරු පරීක්ෂණය - 2024

I පත්‍රය

පැය 1 යි

විභාග අංකය:.....

විභාගයට පෙනී සිටින ඔබට උපදෙස්


- ඔබේ විභාග අංකය ඉහත කොටුව තුළ ඇති තිත් ඉර මත ලියන්න.
- තුන්වැනි පිටුවේ ඇති නියමිත ස්ථානයේ ද ඔබේ විභාග අංකය ලියන්න.
- මෙම ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්න 40 ක් ඇත. ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු මෙම පත්‍රයේ ම ලියන්න.
- පිළිතුරු තුන බැගින් දී ඇති ප්‍රශ්නවල නිවැරදි පිළිතුර තෝරා ඉරක් අඳින්න.
- කටුවැඩ කිරීම සඳහා කඩදාසියක් සපයනු ලැබේ.

උත්තර පත්‍ර පරීක්ෂක වරුන් සඳහා

පිටු අංකය	ලැබූ ලකුණු
02	
03	
04	
05	
06	
07	
08	
එකතුව	
අවසාන ලකුණු	
ඉලක්කමෙන්	
අකුරෙන්	

	කෙටි අත්සන හා
පළමුවන පරීක්ෂක ලකුණු දීමේ පටිපාටියට අනුව උත්තර පත්‍ර ඇගයීම් කළ බවට සහතික කරමි.	V / I / S
දෙවන පරීක්ෂක පළමු පරීක්ෂක කර ඇති ඇගයීම් නිවැරදි බව සහතික කරමි.	
	V / I / S
ඇගයීම් ලකුණු තහවුරු කිරීමේ පරීක්ෂක ඇගයීම් කර, ප්‍රදානය කළ ලකුණු සහ අවසාන ලකුණු	
	V / I / S / EMF
ප්‍රධාන පරීක්ෂක අධීක්ෂණය කළෙමි. අවසාන ලකුණු නිවැරදිය	
	V / I / S / CH

01. මුල් රූපයට සමාන රූපය තෝරා යටින් ඉරක් අඳින්න.




(1) (2) (3)

02. පහත දැක්වෙන සතුන්ගේ නම් කාණ්ඩ දෙකකට වෙන් කළ හැකිය. ඒ අනුව නිවැරදි කාණ්ඩ දෙක තෝරන්න.

උලමා	හාවා	කණාමැදිරියා	ගවයා	අලියා	බස්සා
A	B	C	D	E	F

(1) A E D - B D F (2) C D A - B E F (3) A C F - B D E


03. පහත දී ඇති රූප සටහන උපයෝගී කර ගනිමින් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු තෝරන්න.





මෙහි වැඩිම වටිනාකමක් ඇත්තේ,


(1)  (2)  (3) 

04. මෙහි A හා B ට ගැළපෙන රූප මොනවාද?




(1)  (2)  (3) 

05. පහත රූපයේ දැක්වෙන්නේ ඝනකාභ හැඩයේ ලී කුට්ටි කිහිපයක් එකට අලවා සැදූ ඝන වස්තුවකි එහි A කුට්ටිය නැවත ගැළ වූ විට ලැබෙන කොටස් දෙකෙහි මුහුණත් සංඛ්‍යාව වන්නේ ,




(1) 18 (2) 15 (3) 16


06. සංඛ්‍යා යොදා ඇති රටාව හඳුනාගෙන හිස්තැනට ගැළපෙන පිළිතුර තෝරන්න.



(1) 8




(2) 40



(3) 11

07. ගමනාගමන ක්‍රම දැක්වෙන පහත රූප සම්බන්ධයෙන් දී ඇති ප්‍රකාශවලින් නිවැරදි ප්‍රකාශය තෝරන්න .




(1) සියල්ල ඉන්ධන හා බැඳේ. (2) සියල්ල ගොඩ බිම හා සම්බනධයක් ඇත.

(3) A හ C වලට ඉන්ධන අවශ්‍ය වේ .

08. සමාන පරතරයක් සහිතව ඒකාකාරී වේගයකින් මෝටර් රථ 7 ක් ගමන් කරයී. පිටු පසින් ම ධාවනය වන රථය අනෙක් රථවල වේගයට වඩා වැඩි කරමින් ඉදිරියට ම පැමිණීමට තත්පර 10 ක් ගත වේ. ඒ අකාරයට ම එකින් එක වේගය වැඩි කරමින් පිළිවෙළින් පෙළීයේ අග සිට අනෙක් රථ ද ඉදිරියට යන්නේ නම් පළමුවට යන රථය අන්තිම රථය බවට පත් වන්නට ගතවන කාලය වන්නේ,


(1) තත්පර 70 කි. (1) තත්පර 60 කි. (1) තත්පර 80 කි.

09. සෘජුකෝණාස්‍රාකාර ලෙස නමා සකස් කර තිබූ කම්බියක් නැවුම් ස්ථාන දිගහැර ඇති අයුරු ද එහි දිග ප්‍රමාණය ද පහත දැක්වේ.



මෙම කම්බියම යොදාගෙන සමචතුරස්‍රාකාර ලෙස කම්බිය නැමුවහොත් සමචතුරස්‍රයේ පැති දෙකක දිග කීය ද?


(1) 8 cm (2) 18 cm (3) 9 cm

10. 

ගණක රාමුවක් සහ එහි සංඛ්‍යා නිරූපණයට ගණක 4ක් ඇත.මෙමගින් කුරු දෙකකට පමණක් ගණක නොදමා නිරූපණය කළ හැකි විශාලම සංඛ්‍යාව වන්නේ ,

(1) 4000 (2) 3001 (3) 3100

11. චතුස්තලයක මුහුණතක ත්‍රිකෝණ ඇඳ ඇති අකාරය පහත දැක්වේ. එම චතුස්තලයේ දැකිය හැකි මුළු ත්‍රිකෝණ සංඛ්‍යාව වන්නේ,







(1) 9 (2) 32 (3) 36

12. මල් වේළීම සඳහා පොතක පිටු අතර මල් තබන ළමයෙක් සෑම පිටු දෙකක් අතර මල් එක බැගින් තබනු ලබේ. පළමු කොළේ සිට 12 වෙනි කොළය තෙක් මෙම ළමයාට මල් තබයි.එවිට සෑම මලක් ම ස්පර්ශ වන පිටු සංඛ්‍යාව කීය ද ?


(1) 24 කී　　(2) 48　　(3) 22

13. රටාව අනුව 5 වන ස්ථානයට ගැළපෙන රූපය කුමක්ද?



(1) 　(2) 　(3) 


14. පහත රූප සටහනින් දැක්වෙන්නේ වෙළෙඳ සැලක විකිනීමට ඇති එක් එක් වර්ණවලින් යුතු ඉටිරෙදි ඇති ප්‍රමාණයන් ය .



මෙහි ඇති නිල් ඉටි රෙදි ප්‍රමාණය මීටර 100 ක් නම් කහ ඉටි රෙදි ප්‍රමාණය වන්නේ,

(1) මීටර 100　　(2) මීටර 50　　(3) මීටර 200

15. ළමුන් පිරිසක් අත්වැල් අල්ලා ගෙන පේළියට සිටින ආකාරය පහත දැක්වේ . ඔවුන්ගෙන් රවුමක් සැදීමට කළ යුතු දේ නිවැරදි ව දැක්වෙන පිළිතුර තෝරන්න.




(1) B ළමයා අත් දෙක ම අතහැර ගොස් පේළියේ මුළ සහ අග සිටින ළමයි දෙදෙනාගේ අත්වලින් අල්ලා ගැනීම.

(2) A ළමයාගේ වම් අතින් F ළමයාගේ වම් අත ඇල්ලීම.

(3) F ළමයා තම වම් අතින් A ළමයාගේ දකුණු අත අල්ලා ගැනීම.


16.  මෙම සමචතුරස්‍රයේ වටේ දුර සෙන්ටිමීටර 20 කි. එවැනි සමචතුරස්‍ර 5 ක් එක් කර පහත රූපය සාදා ඇත. එම රූපයේ වටේ දුර කොපමණද?



(1) 60 cm (2) 100 cm (3) 80 cm


17. එක්තරා මාසයක 7 වෙනිදා ඉරිදා දවසකි . එය දින 31 කින් අවසන් මාසයක් නම් දින හතර බැගින් යෙදෙන දවස් දෙකක් සහිත පිළිතුර වන්නේ ,

(1) බ්‍රහස්පතින්දා, සෙනසුරාදා (2) බදාදා ඉරිදා (3) අඟහරුවාදා , බදාදා

18. 

මෙහි දැක්වෙන්නේ 2cm පළල සමචතරස්‍රවලින් සමන් විත කම්බි රාමුවකි. එම කම්බි සියල්ල එකිනෙක ගලවා විශාල සමචතුරසුයක් සැදුවහොත් එහි පැත්තක දිග වන්නේ ,

(1) 80 cm (2) 20cm (3) 40cm

19. 

රවුම තුළ භාග සංඛ්‍යාවලින් $\frac{1}{2}$ ට නොගැළපෙන භාග සංඛ්‍යා කීයක් තිබේ ද?

(1) 3 කි (2) 5කි (3) 4 කි

20. රූපවාහිනී යන්ත්‍රයකට වඩා පරිගණකය මිලෙන් වැඩිය. දුරකතනය, රූපවාහිනී යන්ත්‍රයට වඩා මිලෙන් අඩුය. මේ අනුව මිල වැඩිම භාණ්ඩයේ සිට මිල අඩුම භාණ්ඩය දක්වා නිවැරදිව දැක්වෙන පිළිතුර වන්නේ,

(1) රූපවාහිනිය, දුරකතනය, පරිගණකය (2) පරිගණකය, රූපවාහිනිය, දුරකතනය

(3) දුරකතනය, රූපවාහිනිය, පරිගණකය

21. පැයට කිලෝ මීටර 80 වේගයෙන් ඒකාකාරී වේගයකින් ගමන් කරන මෝටර් රථයකට ඉන්ධන ලිටරයකින් ධාවනය කළ හැක්කේ කිලෝ මීටර 10 කි. එම මෝටර් රථය මිනිත්තු 30 ක් ධාවනයේ යෙදුණු පසු ඉන්ධන ටැංකියේ ඉතුරු වී තිබුණේ ඉන්ධන ලීටර 6 කි . එම රථයේ ගමන ආරම්භයේ දී ඉන්ධන ප්‍රමාණය වන්නේ,

(1) ලීටර 14 (2) ලීටර 10 (3) ලිටර 16

22. ජල ටැංකියක් මිනිත්තු 15 ක දී මුළු ප්‍රමාණයෙන් $\frac{1}{4}$ ක් පිරේ. දැනට එම ටැංකියෙන් $\frac{1}{4}$ ක් පිරී පවතී. ජල ටැංකිය පිරවීමට පෙ.ව.7.20 ට ආරම්භ කළේ නම් ඉතිරි ප්‍රමාණය සම්පූර්ණයෙන් පිරී අවසන් වන වේලාව වන්නේ,

පෙ.ව. 8.20 පෙ.ව. 8.05 පෙ.ව. 8.00

23. පහත මලුවල රුපියල් ප්‍රමාණය මෙන් දෙගුණයක් ඇමරිකන් ඩොලර් තිබේ.ඇමරිකන් ඩොලර් එකක් ගැනීමට රුපියල් 300 ක් අවශ්‍ය වේ . මෙහි රුපියල් සහිත මල්ලේ රු.10 ක කාසි තිබේ .ඩොලර් ප්‍රමාණය රුපියල් 100 නෝට්ටුවලට මාරු කළ විට ඇති රුපියල් ගණන වන්නේ,





(1) රු 2000 යි (2) රු.600 යි (3) රු.6000යි

24. තරිඳු ළඟ රු.140 ක්ද, අමීෂා ළඟ රු.120 ක්ද, නුවන් ළඟ රු.160 ක්ද ඇත. තිදෙනා ළඟ ඇති මුදල් ප්‍රමාණය සමාන කිරීමට කළ යුතු වෙනස්කම වන්නේ,


(1) තරිඳුගේ මුදලින් රු.20 ක්ද, නුවන්ගේ මුදලින් රු.20 ක්ද ඉවත් කිරීම.

(2) තිදෙනාගේම මුදලින් රු.20 බැගින් ඉවත් කිරීම.


(3) නුවන්ගේ මුදලින් රු.20 ක් අමීෂාට ලබා දීම.

25. පහත දැක්වෙන කුඩා ඝනකාභ එක් කොට සාදා ඇති ඝනකාභයකි . එම කුඩා ඝනකාභ සියල්ල ගලවා ● සළකුණ උඩට සිටින සේ එක මත එක තැබුවහොත් සැදෙන ඝන වස්තුවේ උස කොපමණ ද ?

(1) 11cm (2) 10 cm (3) 8 cm



26. පහත රූප සටහනේ ඇති ත්‍රිකෝණ සංඛ්‍යාව කීය ද?




(1) 8

(2) 10

(3) 12

අංක 27 හා 28 ප්‍රශ්න දී ඇති රූපය ඇසුරින් පිළිතුරු ලියන්න.



27. කඩ ඉරි දිගේ නැවූ විට අනුපිළිවෙළින් E හා F සඳහා ගැළපෙන ඉලක්කම් වන්නේ,

(1) 5 හා 6 (2) 7 හා 3 (3) 5 හා 7


28. පහත දැක්වෙන්නේ කම්බි පෑස්සීමෙන් සැදූ දම්වැල් කොටස් කිහිපයකි.



එය තනි දම්වැලක් බවට පත් කිරීමට නැවත කපා පෑස්සිය යුතු පුරුක් ගණන වන්නේ ,

(1) 1 (2) 3 (3) 4

29. පහත රූපය සම්පූර්ණයෙන් වැසීමට අඳුරු කරන ලද ත්‍රිකෝණය වැනි ත්‍රිකෝණ කීයක් අවශ්‍යවේ ද?



(1) 32 (2) 36 (3) 30

30. උදැසනක ම මාදම්පේ හන්දියට ගොස් මාලු මිල දී ගන්නා ජයසේන තම යතුරු පැදියෙන් මාළු විකිනීම සිදුකරන අතර සමාන්‍යයෙන් මාළු කිලෝ ග්‍රෑම් එකකින් රුපියල් 200 ක් ලාභ තබා ගනියි .ඊට අමතරව මාදම්පේ සිට ගමන් කරන සෑම කිලෝමීටරයකට ම රුපියල් 10 ක් බැගින් මිල වැඩි කරයි . ඔහු බළන්ගොඩ නගරයේ දී මාළු කිලෝග්‍රෑම් එකක් රුපියල් 900 ට අලෙවි කරයි . ඔහු මාදම්පෙන් මාළු මිල දී ගත්තේ 500g ක් රුපියල් 200 බැගින් නම් මාදම්පේ සිට බළන්ගොඩට දුර කොපමණ ද?

(1) 50 km (2) 30km (1) 70km

31. පෑන් 2 ක හා පැන්සල් 3 ක මිල රු.66.00 කි. පෑන් 3 ක හා පැන්සල් 2 ක මිල රු.69.00 ක් නම්, පෑන් 5 ක හා පැන්සල් 5 ක මිල වන්නේ,

(1) රු.135.00 (2) රු.145.00 (3) රු.125.00

32. ○○○ = ⬡ ⬡ ⬡ ⬡

⬡ ⬡ = △△△

○ ○ ○ ○ ○ ○ = ...

ශිස්තැනට ගැළපෙන ත්‍රිකෝණ ගණන වන්නේ ,

(1) 6 (2) 12 (3) 9

33. පහත දැක්වෙන කවියේ සමස්ත අදහස මගින් දෙනු ලබන පණිවිඩය තෝරා යටින් ඉරක් අඳින්න.

මවුපිය දෙගුරුන් හා වැඩිහිටියන්

දරු දැරියන් හට ලැබ දෙන ඔවදන්

සිත් තුළ රඳවා ගෙන හද බැතියෙන්

හෙට දින ජයගනු මැන සිත සතුටින්

(1) වැඩිහිටියන් දෙන අවවාද පිළිපැදීමෙන් අනාගතය ජයගත හැකි බව

(2) මවුපියන් දෙන අවවාද පිළිපැදිය යුතු බව

(3) සියලු දෙනා වැඩිහිටියන් දෙන අවවාද පිළිපැදිය යුතු බව

34. අම්මා තේ හා කෝපි බීමට කැමති නමුත් කිරි බීමට කැමති නැත. මල්ලී කිරි හා දොඩම් හා කෝපි බීමට කැමති නමුත් තේ නොබොයි. මම කැමති බීම වර්ග වන්නේ, කිරි, දොඩම් හා කෝපිය. අපි තිදෙනාම කැමති බීම වර්ගය වන්නේ,

(1) තේ (2) කිරි (3) කෝපි

35. විදුහල්පතිතුමා ප්‍රධාන ශිෂ්‍ය නායකයා අමතා මෙසේ පවසයි .

සීනුව මිනිත්තු 45 කට වරක් නාද වෙයි .

අවසාන වරට සීනුව නාද වූයේ මිට මිනිත්තු 25 කට පෙරය .

ඊළඟ සීනුව පෙ. ව. 11.30 ට නාද වෙයි.

ගුරුතුමා මෙම ප්‍රකාශය කළ වේලාව වන්නේ,


(1) පෙ. ව.11.55 (2) පෙ.ව. 10 .45 (3) පෙ . ව. 11.10

36. ළමයෙක් රුපියල් 2 බැගින් ටොෆී මිල දී ගනු ලබන්නේ රුපියල් 20. 00 ක ට ය.ඔහු මිල දී ගන්නා ටොෆිවලින් කොළ දෙකක් කඩයට දුන් විට එක් ටොෆියක් නොමිලේ ලැබේ. ළමයා රුපියල් 20 ක් ගෙවා ටොෆී මිල දී ගත් විට ඔහුට මුදල් ගෙවීමක් නොමැතිව ගත හැකි ටොෆී සංඛ්‍යාව කීයද ?
(1) 5 කි. (2) 19කි. (3) 9

37. සඳුදා ට වඩා රු.20 ක් අඩුවෙන් අඟහරුවාදා ද, අඟහරුවාදාට වඩා රු.10 ක් අඩුවෙන් බදාදා ද දම්සර මුදල් වියදම් කළේය. ඔහු අඟහරුවාදා වියදම් කළේ රු.40 ක් නම්, දින තුනේදීම වියදම් කළ මුළු මුදල කීය ද?

(1) රු.140 (2) රු.130 (3) රු.150

පන්තියක සිටින ක්‍රීඩා කරන හා නොකරන ළමුන් පිළිබඳ දත්ත සටහනක් පහත දැක්වේ .



38. කුමන හෝ ක්‍රීඩාවක් කරන ළමුන් ට සපත්තු ලබා දෙන්නේ නම් අවශ්‍ය සපත්තු කුට්ටම් සංඛ්‍යාව වන්නේ ,

(1) 44 කි (2) 26 කි (3) 22 කි

39. දිශාවන්ගේ පිහිටීම පිළිබඳ නිවැරදි අදහසක් එන පරිදි පහත දැක්වෙන වාක්‍යයේ හිස්තැන් පිරවීම සඳහා සුදුසු වචන ඇතුළත් පිළිතුර තෝරන්න.

දිශා සටහනේ දකුණු දිශාවත් .....දිශාවත් අතර මැද ද වයඹ දිශාවට මුහුණලා සිටින අයෙකුගේ ..... ද දකුණට ට ..... සිටින අයෙකුගේ වම් අත පැත්තෙන් ද ගිනිකොණ දිශාව පිහිටා ඇත.

(1) නැගෙනහිර , ඉදිරිපසින් ද , බටහිරට

(2) බටහිර , වම් පසින් ද , පිටුපා

(3) නැගෙනහිර , පිටුපසින්ද , මුහුණලා

40. එක ම පැත්තට හැරී සිටින ළමයි පේළියක ඔජිත්මාගේ වම් අත පැත්තේ ඈ අසලින් ම සිටින්නේ පේළියේ මැද සිටින ළමයාගෙන් වම් අත පැත්තට දෙවෙනි ළමයා ය. ඔජිත්මාගේ දකුණු අත පැත්තේ ළමුන් 12 ක් සිටීනම් එම පේළියේ සිටින ළමයි සංඛ්‍යාව කීය ද ?

(1) 29 (2) 25 (3) 23

සියලු ම හිමිකම් ඇවිරිණි
All Right Reserved

අංක 01

කලාප අධ්‍යාපන කාර්යාලය - බළන්ගොඩ

පස්වන ශ්‍රේණියේ ශිෂ්‍යත්ව විභාගයට සුදානම් වන දරුවන් සඳහා

ශිෂ්‍යත්ව විභාගය පෙරහුරු පරීක්ෂණය - 2024

II පත්‍රය

පැය 1 යි මිනිත්තු 15

විභාග අංකය:.....

විභාගයට පෙනී සිටින ඔබට උපදෙස්

- ඔබේ විභාග අංකය ඉහත කොටුව තුළ ඇති තිත් ඉර මත ලියන්න.
- තුන්වැනි පිටුවේ ඇති නියමිත ස්ථානයේ ද ඔබේ විභාග අංකය ලියන්න.
- මෙම ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්න 59 ක් ඇත. ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු මෙම පත්‍රයේ ම ලියන්න.
- පිළිතුරු තුන බැගින් දී ඇති ප්‍රශ්නවල නිවැරදි පිළිතුර තෝරා ඉරක් අඳින්න.
- කටුවැඩ කිරීම සඳහා කඩදාසියක් සපයනු ලැබේ.

උත්තර පත්‍ර පරීක්ෂක වරුන් සඳහා

පිටු අංකය	ලැබූ ලකුණු
02	
03	
04	
05	
06	
07	
08	
එකතුව	
අවසාන ලකුණු	
ඉලක්කමෙන්	
අකුරෙන්	

	කෙටි අත්සන හා
පළමුවන පරීක්ෂක ලකුණු දීමේ පටිපාටියට අනුව උත්තර පත්‍ර ඇගයීම් කළ බවට සහතික කරමි.	V / I / S
දෙවන පරීක්ෂක පළමු පරීක්ෂක කර ඇති ඇගයීම් නිවැරදි බව සහතික කරමි.	
	V / I / S
ඇගයීම් ලකුණු තහවුරු කිරීමේ පරීක්ෂක ඇගයීම් කර, ප්‍රදානය කළ ලකුණු සහ අවසාන ලකුණු	
	V / I / S / EMF
ප්‍රධාන පරීක්ෂක අධීක්ෂණය කළෙමි. අවසාන ලකුණු නිවැරදිය	
	V / I / S / CH

01 **පහත සඳහන් ඡේදය කියවන්න**

පේරාදෙණිය විශ්ව විද්‍යාලය පිහිටි භූමිය ඉතා අලංකාර ය. දෙපස ඇති රුක්ස ගස්වලින් පිවිසුම් මාර්ගය සෙවණ වී ඇත. මැයි, මාර, රොබරෝසියා ආදී ගස්වලින් කඩා හැලෙන කහ පැහැති මල් විටින් විට වැටෙන්නේ මල් වැස්සක් වසින්නාක් මෙනි. විශ්වවිද්‍යාල අධ්‍යාපනය ලබන ශිෂ්‍ය ශිෂ්‍යාවන් මේ පරිසරයේ ඔබ මොබ ගමන් කරනු අපට දක්නට ලැබුණි. ඔවුන් ඉතා සැහැල්ලුවෙන් හා සතුටින් කාලය ගත කරන බව අපට හැඟුණි.

- ❖ ඡේදය කියවා ඡේදය ඇසුරින් පිළිතුරු සපයන්න.

(i). විශ්වවිද්‍යාල භූමියේ ඔබ මොබ ගමන් කරන්නේ කවු ද? .....

(ii). දෙපස ඇති රුක්ස ගස්වලින් ඉටු වන සේවාව කුමක් ද?
.....

(iii). ඡේදයේ සඳහන් මල් කුමන පැහැයක් ගනී ද? .....

(iv). ඉතා අලංකාර වූ ස්ථානය කුමක් ද? .....

(v). 'ප්‍රවේශ මග' යන්න ඡේදයේ යොදා ඇත්තේ කෙසේ ද? .....

(vi). ඡේදයේ සඳහන් උපමාව ලියන්න. .....

(02). පහත සඳහන් එක් එක් වගන්තියෙහි උක්ත ආඛ්‍යාත සම්බන්ධය නිවැරදි නම් (√) ලකුණ ද වැරදි නම් (×) ලකුණ ද ඉදිරියේ ඇති වරහන තුළ යොදන්න.

(i) වැද්දා දඩයම් පිණිස වනයට ගියේ ය. ( )

(ii) ළමයි අධ්‍යාපන චාරිකාවට සහභාගී වෙති. ( )

(iii) දෙමාපියන් රැස්වීමට පැමිණ සිටියහ. ( )

(iv) නංගී උදෑසන ම පාසලට ගියහ ( )

(v) ඔවුහු අපට යහමඟ පෙන්වූහ. ( )

(03) ඒකවචන අතීත කාල ක්‍රියා පදය යටින් ඉරක් අඳින්න.

ගියහ බලයි ගියේ ය

(4) පහත එක් එක් ප්‍රශ්නයෙහි **නිවැරදි අක්ෂර සහිත වචනය** තෝරා යටින් ඉරක් අඳින්න.

(i) කණගාටුව බනගාටුව කනගාටුව

(ii) කිවිදිය කිවිඳිය කිවිධිය

(iii) ලේකනය ලේඛණය ලේඛනය

(5) පහත වාක්‍ය වර්තමාන කාල **ඒක වචනයට** හරවා ලියන්න.

අපි පාසල් වැඩවල නිතර වෙමු.

.....

(6) **සමාන** පද ලියන්න. **විරුද්ධ** වචනයක් ලියන්න.

(i) පාදය - ..... (ii) වැරදි .....

(06) පහත වගන්තිවලට ගැළපෙන ඉඟි වැකි වරහන් තුළින් තෝරා ලියන්න.

(මුරුංගා අත්තේ තියනවා / ඇඟ බේරා ගන්නවා / අහසේ මාලිගා තනනවා)

(i). ඉටු නොවන සිහින මැවීම-

.....

(ii). වගකීමෙන් බේරීම.

.....

(07) සුදුසු විරාම ලකුණු යොදන්න.

ආයුබෝවන් දරුවනේ ඊළඟ දවසේ අපි තවත් සෙල්ලමක් කරමු

(08) එක් එක් රූපයට ගැළපෙන ඉංග්‍රීසි වචනය ලියන්න.





....

(09) පහත දී ඇති වචන නිවැරදි ව ගළපා අර්ථවත් වැකියක් බැගින් ලියන්න.

(i) do / have? / you / How / many / sisters

.....

(ii) has / She / a /frock / beautiful

.....

(10) එක් එක් ඉංග්‍රීසි වචනයෙහි **අර්ථය සිංහලෙන්** ලියන්න

Vegetables - ..... Waterfall.....

(11) **නණ්බන්** 'යන දෙමළ වචනය සඳහා යෙදෙන සිංහල වචනය ලියන්න.


.....

(12) පහත සඳහන් වාක්‍ය **දෙමළෙන් කියන ආකාරය** සිංහලෙන් ලියන්න.

1. වේලාව කීය ද? .....

2. එනක්කු පන්දු තාරුංගල්. .....

(13) ගණක රාමුවෙහි දැක්වෙන සංඛ්‍යාවට පහක් වැඩි සංඛ්‍යාව ඉලක්කමෙන් ලියන්න.



.....

(14)

5	8
2	7

කොටුව තුළ ඇති සියලුම ඉලක්කම් යොදාගෙන **5** ඉලක්කමෙන් නිරූපිත අගය 500 ද

2 ඉලක්කමෙන් නිරූපිත අගය 20 ද වන ඉලක්කම් හතරේ සංඛ්‍යා 2 ක් ලියන්න.

....

(15) රටාව හඳුනාගෙන හිස්තැනට ගැළපෙන සංඛ්‍යාව ලියන්න.

(i) 47, ... , 65 , 74 , 83 (ii) 1 , 3 , ... , 27 , 81

(16) බස් රථයක මගීන් 48 ක් සිටිති. පළමු නැවතුමේ දී 9 දෙනෙකු බැස ගිය අතර 13 දෙනෙකු බසයට ගොඩ වූහ. දැන් බසයේ මගීන් කී දෙනෙක් සිටී ද? .....

(17) පොත් 28 කින් (හතරෙන් පංගු තුනක) $\frac{3}{4}$ ට පොත් කීයද? .....

(18) ත්‍රිකෝණාකාර මුහුණත් පමණක් ඇති ඝනවස්තුව කුමක් ද? .....

(19) 16 m ක් දිග රබන් පටියකින් 3m 15cm කෑලි 4 ක් කපා ඉවත් කළ විට ඉතිරි කොටසේ දිග කොපමණ ද? .....

(20) ප.ව.10.30 ට පැය දෙකකට පසු වේලාව පැය 24 ඔරලෝසු වේලාවක් ලියන්න.

.....

(21) පැකට්ටුවක ටොෆි 204 ක් ඇත. එවැනි පැකට් 4 ක ඇති ටොෆි ගණන කීය ද? .....

(21) P නගරයේ සිට Q නගරයට දුර 80 km කි. එම දුරෙන් 20 km 850 m දුරක් බසයෙන් ගිය තාරක ඉතිරි දුර දුම්රියෙන් ගමන් කළේ ය. තාරක දුම්රියෙන් ගමන් කළ දුර කොපමණ ද ?


:.....km.....m

(22) කරාබු නැටි 1 kg ක් රුපියල් 1600.00 බැගින් මිලට ගත් වෙළෙන්දෙක් ඒවා 50 g බැගින් වූ කුඩා පැකට් සකස්කර විකිණුවේ ය. එම පැකට් එකකින් රු. 20.00 ක ලාභයක් ලැබුවේ නම් වෙළෙන්දා එම කුඩා කරාබු නැටි පැකට් එකක් විකුණූ මිල කීය ද ?

.....

(23) ජලය ලීටර 4 ක් අල්ලන භාජනයක් සම්පූර්ණයෙන් පිරවීමට මිලි ලීටර 250 කෝප්පයකින් ජලය දැමිය යුතු වාර ගණන කීයද? .....

(24) මෙම රූපයෙන් **තවත්** 0.3 ක් අඳුරු කරන්න.



(25) රුපියල් 75.00 කට පෑනක් ද, රුපියල් 27.50 කට අඩිකෝදුවක් ද, මිලට ගෙන රුපියල් 150.00 ක් දුන් විට ලැබිය යුතු ඉතිරි මුදල කීය ද? .....

(26) පහත බිල්පත සම්පූර්ණ කරන්න.

ද්‍රව්‍ය	මිලට ගත් ප්‍රමාණය	1kg ක මිල	වටිනාකම
		රුපියල් සත	රුපියල් සත
සීනි	2 kg	.....	440 00
කඩල	.....	280 00	140 00
මිරිස්	200 g	550 00	.....
මුළු මුදල			.....

❖ පහත එක් එක් ප්‍රශ්නයට සුදුසු පිළිතුර දී ඇති පිළිතුරු අතුරෙන් තෝරා **යටින් ඉරක් අඳින්න.**

(27)පාසල් සිසුන් තුළ තිබිය යුතු ගුණාංගයන් පමණක් ඇතුළත් පිළිතුර තෝරන්න.

1. ක්‍රමවත් බව, ඉවසීම, කලබල වීම
2. ආත්මාර්ථකාමී බව, පිළිවෙළ, ඉවසීම
3. ක්‍රමවත් බව, ඉවසීම, උපදෙස් පිළිපැදීම

(28) තවාන් දමා පැළ ලබා ගතහැකි බෝග වර්ග පමණක් අඩංගු පිළිතුර තෝරන්න.

1 බෝංචි මිරිස්, වට්ටක්කා 2. මිරිස්, වම්බටු, තක්කාලි 3. වැටකොළු, පතෝල, කව්පි

(29) රාජ්‍ය ලාංඡනයේ සෞභාග්‍ය හා පරිපූර්ණ බව පෙන්නුම් කරන්නේ


1 පුන්කලසින් 2 වී කරලින් 3 ධර්ම චක්‍රයෙන්

(30) කාල නියමයක් නොමැතිව මල් පිපෙන ශාක වර්ග පමණක් අඩංගු පිළිතුර තෝරන්න.

1 පොල් , කෙසෙල් , වතුසුදු 2. ඇහැළ, සල්, චිරබදු 3 .බිනර, වෙසක්, මැයි, ඇහැළ

(31) රෝග වාහක පුද්ගලයන් මගින් බෝවන රෝගය නොවන්නේ,

(1) මී උණ (2) කොරෝනා (3) පැපොල



(32) මෙම මාර්ග සංඥාව දැකිය හැකි ස්ථානයක් වනුයේ,

1. පන්සලක් ඉදිරියේ
2. බැංකුවක් ඉදිරියේ
3. උසාවියක් ඉදිරියේ

(33) ''විනාකිරි'' යොදාගෙන රසවත් කරනු ලබන ආහාරයක් වන්නේ,

1 වට්ටක්කා 2 කළුපොල් මාළුව 3 අච්චාරු

(34) බර අඩුවීම, ශරීර වර්ධනය හීනවීම ඇතිවන්නේ පිළිවෙළින් කුමන පෝෂ්‍ය පදාර්ථ නිසි පරිදි නොලැබීමෙන් ද?

1. ප්‍රෝටීන් හා කාබෝහයිඩ්‍රේට්
2. කාබෝහයිඩ්‍රේට් හා විටමින්
3. කාබෝහයිඩ්‍රේට් හා ප්‍රෝටීන්

(35) දකුණු හා බස්නාහිර පළාත් දෙකට අයත් නගර දෙක පිළිවෙළින් දැක්වෙන පිළිතුර තෝරන්න.

1. හම්බන්තොට, රත්නපුර 2. ගාල්ල, පුත්තලම 3. ගාල්ල, කොළඹ

(36) විදුලිය භාවිත කිරීමේ දී අප විසින් නොකළ යුතු දෙයකි.

1. පාවහන් පැළඳ විදුලිය උපකරණ පරිහරණය කිරීම.
2. අකුණු අවස්ථාවක දී ප්‍රධාන ස්විචය විසන්ධි කිරීම.
3. තෙත අත්වලින් විදුලිය උපකරණ ඇල්ලීම.

(37) ශ්‍රී ලංකාවට ආසන්නයෙන් ම පිහිටි දූපත් රාජ්‍ය වන්නේ,

1. ඉන්දියාව 2. පකිස්ථානය 3. මාලදිවයින

(38) අතීතයේ අපේ රටට විශාල කීර්තියක් ගෙන ආ අවස්ථාවකි,

1. කෙම් ක්‍රම හා හෙළ වෙදකම් 2. නව නිපැයුම් තුළින්
3. යුද්ධය මඟින්

(39) මුහුදු වෙරළ ආශ්‍රිතව පිහිටා නොමැති පළාතකි,

1. වයඹ 2. ඌව 3. නැගෙනහිර

(40) නගරයක ගමන් කරන වාහනයක් ආලෝක සංඥා පුවරුවක් අසල දී එක් වරම නැවැත්වීය. එම අවස්ථාවේ පුවරුවේ දැල් වී තිබුණු වර්ණය වන්නේ

1 කොළ 2 රතු 3 කහ

(41) 

මෙහි චුම්භක බලය වැඩිකිරීමට කළ යුත්තේ,

1. කම්බියේ දඟර ගණන අඩු කිරීම
2. වියළි කෝෂ ගණන වැඩි කිරීම
3. තඹ කම්බිය වෙනුවට යකඩ කම්බියක් ගැනීම

(42) දකුණු පළාතෙන් හා උතුරු පළාතෙන් මුහුදට වැටෙන ගංගා දෙකක් වන්නේ

1. නිල්වලා - මල්වතු 2. කැළණි - නිල්වලා 3. නිල්වලා - කළු

(43) මෙම ක්‍රියාකාරකම මඟින් නිරීක්ෂණය කරන ලද්දේ කුමක් ද?

1 . පණුවන් කතුරුමුරුංගා කොළ කන ආකාරය

2. සමනලයාගේ ජීවන චක්‍රයේ එක් අවස්ථාවක්

3. පණුවන් බිත්තරයෙන් එළියට එන ආකාරය



(44) ඉන්ධන සහිත ස්ථානයක හදිසි ගින්නක් ඇතිවුවහොත් එය නිවා දැමීමට වඩාත් සුදුසු වන්නේ,

1. ඝනකම් රෙදිවලින් ගින්න වැසීම.

2. වතුර දමා ගින්න නිවා දැමීම.

3. වැලි දමා ගින්න නිවා දැමීම.

(45) සිංහල ජන ක්‍රීඩාවක් වන්නේ,

1. ඔලිඳ කෙළිය 2. අත්පන්දු 3. නෙට්බෝල්

(46) ප්‍රථමාධාර ලෙස අප අදහස් කරන්නේ,


1 රෝගියෙක් රෝහල්ගත කිරීමෙන් පසුව ලබා දෙන ප්‍රතිකාරය යි.

2 වෛද්‍ය ප්‍රතිකාරවලට පෙර තාවකාලිකව කරනු ලබන ප්‍රතිකාරය යි.

3 දැඩි සත්කාර ඒකකයට යොමුකර කරනු ලබන ප්‍රතිකාරය යි.

(47) රූපයේ දැක්වෙන ක්‍රීඩාව හදුන්වන නම කුමක්ද?

1. කබඩි 2. බට්ටා පැනීම 3 වල කපු ගැසීම



(48) තම පිට මත පැටවුන් තබාගෙන යන්නේ,

1.ඊළුවා 2. ඈයා 3. ලේනා

(49) ජනවාරි සහ දෙසැම්බර් මාසයේ පවත්වන උත්සව දෙකක් පිළිවෙළින් සඳහන් පිළිතුර කුමක්ද?

1. දීපවාලී - තෙපොංගල් 2. රාමසාන් - හජ්පි 3. තෙපොංගල් - නත්තල

(50) ජාතික ධජය අඩකුඹු කරන අවස්ථාව කුමක්ද?

1. නිදහස් උත්සවය 2. ජාතික ශෝක දිනයක 3. අවමංගල උත්සවයක දී

(51) හෙළයේ මහා ගත්කරු,කොග්ගල මහා ප්‍රඥයා යන අන්වර්ථ නාමවලින් හඳුන්වන්නේ කවුද?

1. කුමාරතුංග මුනිදාස මහතා 2. මහගමසේකර මහතා 3. මාර්ටින් වික්‍රමසිංහ මහතා

(52) ශ්‍රී ලංකාවේ වියළි කලාපයට අයත් දිස්ත්‍රික්කයකි,

1. නුවරඑළිය 2. රත්නපුර 3. අනුරාධපුරය

(53) ශ්‍රී ලංකාවට ඒක දේශික ශාක කාණ්ඩය යටින් ඉරක් අඳින්න.

1. හීංබෝවිටියා,හොර,රටදෙල් 2. කෙකටිය,දෝතලු,මාවේවැල් 3. බිං කොහොඹ,හරන් කහ,බෝ

(54) ලංකාව ආක්‍රමණය කළ පෘතුගීසීන් පැමිණි වර්ෂය තෝරන්න

1. ක්‍රි.ව. 1505 2. ක්‍රී ව 1658 3. ක්‍රි ව 1796



(55) පහත අවස්ථාවේ දැක්වෙන වැඩ පහසු කරන ක්‍රම ශිල්පය වන්නේ

1. රෝදය හා දණ්ඩ 2 .ආනත තලය 3. කප්පිය හා දම්වැල

(56)) මාළුවෙකු විසින් තම මුඛයෙන් එකම තරමේ වායු බුබුළු පිටකරන අවස්ථා හතරක් පහත වේ. එයින් නිවැරදි ව දක්වා ඇති අවස්ථාව කුමක් ද?



සමන්ගේ නිවසට ජනිත් පැමිණියේ තද වැස්සේ ය. ඒ වන විට සමන්ගේ ගෙමිදුල ජලයෙන් පිරී තිබුණි **අපි කඩදාසි ඔරු පා කරමු** . ජනිත් කීවේ ය. සමන් ඔබ යැයි සිතා ඉන් පසු සිදු කරන දේ පිළිබඳ ව වාක්‍ය තුනක් ලියන්න .

(සෑම වාක්‍යයක ම වචන පහකට නොඅඩුවිය යුතු ය .උත්ක ආඛ්‍යාත සම්බන්ධය හා අක්ෂර වින්‍යාසය නිවැරදි විය යුතුය.)

(57).....

.....

(58).....

.....

(59).....

.....

(අත් අකුරු හා පිරිසිදු, බවට ලකුණු දෙකක් හිමිවේ.)